දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012
First Term Test - 2012

ඉතිහාසය

10 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ......................................................................

විභාග අංකය : ..................

* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

1. ග්‍රීක පර්සියානු යුද්ධ පිළිබඳව වටිනා ග්‍රන්ථයක් ලියූ ඉතිහාසයේ පියා ලෙස හැඳින්වෙන්නේ. .............................................

2. ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහය ලෙස හැඳින්වූ ඉතිහාසඥයා වන්නේ ............................................. ය.

3. යම් කාලයක හෝ දේශයක ඉතිහාසය නිවැරදිව අවබෝධ කර ගැනීම සඳහා දැනට ශේෂව තිබෙන දේවල් ............................................. ලෙස හඳුන්වයි.

4. රෝම ජාතික ............................................. ගේ 'නැචුරාලිස් හිස්ටෝරියා' නම් කෘතියේ ලංකාවේ ආර්ථික තොරතුරු දක්වා ඇත.

5. ඉන්දියානු ග්‍රන්ථ අතර ............................................. ගේ අර්ථ ශාස්ත්‍රයේ 'තාම්‍රපර්ණි' සහ 'පාර සමුද්‍ර' යන නම් වලින් ලංකාව හඳුන්වා ඇත.

6. ක්‍රි.ව. 9 වන සියවසේ විසූ අරාබි ජාතික සුලෙයිමාන් විසින් ලංකාව ............................................. යන නමින් හඳුන්වා ඇත.

7. සෙල්ලිපි, තඹ පත්, රන්පත් ආදි ............................................. මූලාශ්‍ර වර්තමානයේ ඉතිහාසය වඩාත් සාර්ථකව අධ්‍යයනය කිරීම සඳහා භාවිතයට ගනී.

8. මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තණබිම් ප්‍රදේශයේ සිට ............................................. දුර්ගය ඔස්සේ ඉන්දියාවට පැමිණි ආර්යයන් පන්ජාබ් ප්‍රදේශයේ පදිංචි වූහ.

9. ආර්ය පාලන සංවිධානය යටතේ ගම් වැසියන් ගෙවිය යුතු බදු එකතු කිරීම ............................................ පැවරිණ.

10. මෞර්ය යුගයේ අශෝක රජතුමාගේ කාලයේ ............................................ පැවැත්වීම වැදගත් ආගමික කටයුත්තකි

11. බුදු පිළිම නෙලීම පළමුවෙන්ම ආරම්භ වූ කාලය ලෙස සැලකෙන්නේ ............................................ රජුගේ සමයේදීය.

12. ගුප්ත යුගයේ ලෝකයේ ඉමහත් කීර්තියක් ඉසුලූ බෞද්ධ අධ්‍යාපන ආයතනයක් ලෙස ............................................ විශ්ව විද්‍යාලය සැලකේ.

13. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මත පමණක් ගොඩනගන ඉතිහාසය අයත් අවධිය ............................................ යුගය ලෙස හඳුන්වයි.

14. මධ්‍ය ශිලා යුගයේ ශ්‍රී ලංකාවේ වාසය කළ ආදි මානවයා ............................................ යන නමින් මානව විද්‍යාත්මකව හඳුන්වයි.

15. විජය කුමරුගේ සොහොයුරු වූ සුමිත්ත කුමරුගේ පුත් ............................................ හා පිරිස ලංකාවට පැමිණි තෙවන ආර්ය කණ්ඩායම ලෙස සැලකේ.

(ලකුණු 30)

* ප්‍රශ්න අංක 16 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

16. උතුරු ඉන්දියාවේ අභිෂේක ක්‍රමය හඳුන්වා දීම, දශරාජ ධර්මයට අනුව පාලනය ගෙන යාම මෙරටට හඳුන්වා දෙනු ලබන්නේ කුමන රජුගේ පාලන කාලයේද ?

17. සද්ධර්මරත්නාවලිය, කව්සිළුමිණ, පූජාවලිය, බුත්සරණ, ආදි සාහිත්‍ය මූලාශ්‍ර අයත් වන යුගය නම් කරන්න.

18. මිනිස්කම උතුම් කොට සලකා තම රට වැසියන්ට සුහසෙත සැලසූ ඉන්දියානු ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම රජතුමා කවුරුන්ද ?

19. ඉන්දියාවේ ආර්ය ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍ර 2 ක් නම් කරන්න.

20. මෙරට කැනීම් වලදී රෝම කාසි බහුලව හමු වූ ස්ථාන 2 ක් නම් කරන්න.

21. ප්‍රාග් ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ පැවති සුසාන භූමි පිළිබඳ තොරතුරු හමු වූ ස්ථාන 2 ක් නම් කරන්න.

22. ධර්මාශෝක රජතුමා ඉතාමත් සමීප සම්බන්ධතා පැවැත් වූ රටවල් 2 ක් කරන්න.

23. ක්‍රි.පූ. 544 දී විජය කුමරු ඇතුළු පිරිස පැමිණෙන විට මෙරට විසූ ගෝත්‍ර 2 ක් නම් කරන්න.

24. අශෝක රජතුමා යුද්ධ කිරීම පිළිබඳ බලවත් චිත්ත සංතාපයට පත් වීමට හේතුව කුමක්දැයි දක්වන්න.

25. ආර්ය කණ්ඩායම් පැමිණීමට පෙර පවා මෙරට තාක්ෂණික දියුණුවක් පැවති බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂිය කුමක්ද ?

26. භද්දකච්චායනා කුමරිය ඇතුළු පරිවාර කුමරියෝ තිස් දෙනෙකු ශ්‍රී ලංකාවට ගොඩබට වරාය නම් කරන්න.

27. පෙර සිටි රජවරුන් අනුගමනය කළ, පාලන නිති රීති අනුගමනය කරමින් ගෙන ගිය ක්‍රමය කුමක්ද?

28. අනුරාධපුර යුගයේ දී විදේශ ආධිපත්‍යයෙන් රට මුදවා ගෙන මුළු දිවයිනම එක්සේසත් කළ රජු නම් කරන්න.

29. පළමු කාශ්‍යප රජු ඉදිකළ සීගිරි බලකොටුවේ විශිෂ්ට නිර්මාණ 2 ක් නම් කරන්න.

30. ශ්‍රී ලංකාවේ මුල් ආර්ය ජනාවාස ගංගා නිම්න ආශ්‍රිතව පිහිටුවා ගැනීමට බල පෑ හේතු 2 ක් දක්වන්න.

* මෙහි A හා B වශයෙන් ආර්ය ජනාවාස හා ගංගා නිම්න කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදි පිළිවෙලට ගලපන්න.

| A | | B |
|---|---|---|
| අනුරාධගාම | - | ගම්භීර නදිය |
| උරුවේලගාම | - | කරින්ද නදිය |
| උපතිස්ස ගාම | - | මහා වාලුකානදිය |
| මහාගාම | - | ගෝණ නදිය |
| විජිත ගාම | - | කදම්බ නදිය |

(ලකුණු 10)

* x හා y නිවැරදි පිළිවෙලට ගලපන්න.

| X | | Y |
|---|---|---|
| A වළගම්බා රජතුමා | 1. | කාලිංග මාඝ ආක්‍රමණය |
| B පළමු විජයබාහු රජතුමා | 2. | අනුරාධපුර රාජධානිය |
| C මහසෙන් රජතුමා | 3. | පුලහස්ථ ඇතුලු පිරිස ආක්‍රමණය |
| D පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා | 4. | පණ්ඩු , පාරින්‍ද ඇතුළු පිරිස් ආක්‍රමණය |
| E පණ්ඩුකාභය රජතුමා | 5. | චෝලයන් පරාජය කිරීමට හමුදා මෙහෙයවීම |

(ලකුණු 10)

* පහත (2) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුනු කොට නම් කරන්න.

2) මහාතිත්ථ , සෙන්කඩගල පුර, ගොඩවාය , ජජ්ජර නදිය, අනුරාධගාම , පරාක්‍රම සමුද්‍රය, උපතිස්ස ගාම, මහියංගනය , කොලොම්තොට , ජම්බුකෝලපට්ටන.

(ලකුණු 20)